සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව - 2016
-----------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
---------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ( SLFRS for SMEs) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම
------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දැක්වෙන කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

1.4 මතය ව්‍යාවනය සඳහා පදනම
----------------------------

(අ) පද්ධතියේ බිඳවැටීම හේතුවෙන් සමාගමේ පරිගණක ආශ්‍රිත ගිණුම් පද්ධතියට ප්‍රවේශ වීමට නොහැකි විය. ඒ හේතුවෙන් ලෙජරයේ ඇති විස්තර පරීක්ෂා කිරීමට මට නොහැකි විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු.94,711,011ක ශුද්ධ පාඩුවක් සමාගම විසින් දරා තිබුණි. එබැවින් 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු වගකීම් රු.572,169,869 කින් එහි මුළු වත්කම් ඉක්මවා තිබූ අතර සමාගමේ ජංගම වගකීම් එහි ජංගම වත්කම් රු.291,144,552 කින් ඉක්මවා තිබුණි. තවද, සමාගමේ ඇතැම් නිෂ්පාදන සඳහා දළ ලාභ ආන්තිකය සෘණ අගයක පැවති බව මාගේ අවධානයට ලක් විය. ණය ආපසු ගෙවීම සිදු නොකිරීම හේතුවෙන් විවිධ පාර්ශවයන් විසින් සමාගමට එරෙහිව දැනටමත් නඩු පවරා ඇත. මෙම කරුණු අනුව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පැවතෙන බව පෙනී යන බැවින් සමාගමේ අඛණ්ඩ පැවැත්මේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් පවතී. කෙසේවෙතත් මෙම කරුණු සම්බන්ධයෙන් කළමනාකරණ සැලසුම් පැවති බව හෝ වෙනත් අවම කිරීමේ කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් සහිතව මෙම කරුණ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් නොකරයි.

(ඇ) සමාගම රාජ්‍ය ආයතන කිහිපයකින් ණය, තාවකාලික ණය සහ අත්තිකාරම් ලබාගෙන ඇත. කෙසේ වුවද, එවැනි ණය, තාවකාලික ණය සහ අත්තිකාරම්වලට අදාළ නියමයන් සහ කොන්දේසි සමාලෝචනය කිරීම සඳහා ගිවිසුම් හෝ වෙනත් ආධාරක ලියකියවිලි ඉදිරිපත් කර නොමැත. ඒ හේතුවෙන්, 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.304,855,185ක් වූ ණය තාවකාලික ණය සහ අත්තිකාරම් සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම පිළිබඳව සෑහීමකට පත්

වීමට මා හට නොහැකි විය. තවද, ඉහත ණය ගිවිසුම් හෝ වෙනත් ආධාරක ලියවිලි නොමැතිවීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන රු.13,941,149 ක්වූ මූල්‍ය පිරිවැය පිළිබඳ සම්පූර්ණත්වය සම්බන්ධයෙන් සත්‍යාපනය කිරීමට ප්‍රමාණවත්, උචිත සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

(ඇ) දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් හෝ විස්තරාත්මක උපලේඛන සමාගම විසින් පවත්වා නොතිබුණු අතර 2016 දෙසැම්බර් 31 දිනට රු.29,634,577 ක්වූ වටිනාකමකට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් කර තිබූ දේපල, පිරියත හා උපකරණ පිළිබඳ තක්සේරුව හා සම්පූර්ණත්වය සම්බන්ධයෙන් තහවුරු කර ගැනීමට හෝ විකල්ප අර්ථයන් පරීක්ෂා කිරීමට මට නොහැකි විය.

(ඉ) ඉඩම් හා ගොඩනැගිලි, කාර්යාල උපකරණ හා මෝටර් ලොරිවල සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් රු.1,409,710 , රු.305,801 සහ රු.1,141,375ක් පිළිවෙලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන රු.48,543,442ක්වූ දිගු කාලීන හිඟහිටි ලැබිය යුතු ශේෂය සඳහා සමාගම විසින් හානිකරණයක් (බොල්ණය හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදන) සලසා නොතිබුණි.

(උ) කාර්ය මණ්ඩලය සඳහා ලබා දුන් රු.3,895,553ක් වූ විවිධ අත්තිකාරම් වර්ෂ තුනකට වැඩිකාලයක සිට අයනොවී පැවතුණි.

(ඌ) 2016 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.38,299,070 ක්වූ රජයේ ප්‍රදාන ලෙස දැක්වෙන ප්‍රමාදකල ආදායම්, ගිවිසුම්, විස්තරාත්මක උපලේඛන ආදිය ඉදිරිපත් නොවීම හේතුවෙන් නිරවද්‍යතාවය තහවුරු කළ නොහැකි විය.

(එ) 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.177,741,633 ක්වූ ගෙවිය යුතු, ජාතිය ගොඩනැගීමේ බදු, ව්‍යාපාර පිරිවැටුම් බදු, වෙළෙඳ හා අනෙකුත් වියදම් හා එකතු කළ අගය මත බදු යනාදියෙහි විස්තරාත්මක උපලේඛන, බදු වාර්තා, බදු ගණනය කිරීම් විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවායේ නිරවද්‍යතාවය තහවුරු කළ නොහැකි විය.

(ඒ) දිගින් දිගටම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ස්කන්ධය යටතේ වූ රඳවාගත් සංචිත හර ශේෂය රු.16,113,722ක් විය. එසේ වුවද උපලේඛන, අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා, වැනි ප්‍රමාණවත් උචිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ශේෂයෙහි නිරවද්‍යතාවය තහවුරු කළ නොහැකි විය.

(ඔ) 2016 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රඳවාගත් ලාභවල පෙර වර්ෂ ගැළපීම් අගය වූ රු.60,948,661ක් සම්බන්ධයෙන් අනුමැතීන්, විස්තරාත්මක උපලේඛන වැනි ප්‍රමාණාත්මක, උචිත විගණන සාක්ෂි නොවීය.

ඉහත කරුණු හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දේපල, පිරියත හා උපකරණ, වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්, විලම්බිත බදු වත්කම්, ණය මුදල් හා තාවකාලික ණය මුදල්, වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්, ගෙවිය යුතු ආදායම් බදු මූල්‍ය පිරිවැය සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හා හෙළිදරව් කිරීම් සහ මූල්‍ය උපකරණ සඳහා සම්බන්ධිත හෙළිදරව් කිරීම් පරීක්ෂා කිරීමට මට නොහැකි විය. මෙම කරුණුවල ප්‍රතිඵලයක් ලෙස, 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් කිසියම් ගැළපීම් අවශ්‍ය වේද යන්න මට තීරණය කළ නොහැකි විය.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **මතය ව්‍යාවනය කිරීම**

**මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දැක්වෙන කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.**

**2.1.1** **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම**

**2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ අවශ්‍ය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.**

**අ.** **මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.**

**ආ.** **මගේ මතය වනුයේ,**

- **ඉහත සඳහන් පරිදි විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා වෙත ඉදිරිපත් නොකරන ලදි. එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.**